# ඩෙංගු රෝගය වළක්වාලීම සහ පාලනය සඳහා කඩිනම් අන්තර්පාර්ශ්වීය වැඩසටහන

ජාතික ඩෙංගු මර්දන ඒකකය
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ඩෙංගු මර්දනය පිළිබඳ
ජනාධිපති කාර්ය සාධක බලකාය

## ඩෙංගු රෝගය පාලනය කිරීමේ සහ වැළැක්වීමේ සැලැස්ම


| අනුක්‍රමික අංකය | ආයතන | පිටු අංකය |
| --- | --- | --- |
| | පසුබිම | 1 |
| **1.** | රජයේ සහ පෞද්ගලික ආයතන සහ ආගමික ස්ථාන සඳහා | 3 |
| **2.** | පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා | 5 |
| **3.** | නිවාස පරිශ්‍ර සඳහා | 8 |
| **4.** | ඉදිකිරීම් පරිශ්‍ර සඳහා | 10 |
| **5.** | ධීවර වරාය සහ ධීවර බෝට්ටු සඳහා | 12 |
| **6.** | ජනමාධ්‍ය සඳහා | 13 |

## *අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය*

*ඝන වනාන්තර එළිපෙහෙළි කොට, රුදුරු වන සිව්පාවුන් මෙල්ල කොට, ගොඩනැඟූ මිනිස් ශිෂ්ඨාචාරය, අභ්‍යවකාශ යුගයක් දක්වා ගමන් කරමින් තිබිය දී, ශ්‍රී ලාංකිකයින් වන අප මදුරුවෙකුගේ ජීවන චක්‍රය ඉදිරියේ දණ නමන්නේ ද යන තීරණාත්මක අභියෝගය අප හමුවේ පවතී.*

*රජයේ රෝහල් ඩෙංගු රෝගීන්ගෙන් පිරී ඉතිරී යන තරමේ අවදානමක් අප වෙත පැමිණ තිබිය දී, තවදුරටත් එය අනෙකාගේ ප්‍රශ්නයක් ලෙස ගැනීමට අපට නුපුළුවන.*

*ඩෙංගු තවදුරටත් සෞඛ්‍ය ප්‍රශ්නයක් නොව සංස්කෘතික ප්‍රශ්නයකි. අපගේ කසළ නිසි ලෙස බැහැර කිරීමට අප අසමත් වන්නේ නම්, අපගේ ගේ දොර, ගෙවතුවල මදුරු අහුමුළු සඟවා තබන්නේ නම්, මහා නගර මංපෙත්වල මදුරු තවාන් සඳහා ඉඩ තබන්නේ නම්, අප ශිෂ්ඨාචාරගත මිනිසුන් ලෙස තවදුරටත් සැළකිය නොහැකිය.*

*ඩෙංගු සම්බන්ධයෙන් වන අපගේ වගකීම සාමූහික සමාජයීය වගකීමකි. එහි අප සැමට පැවරුමක් ද පුහුණු කළ යුතු අභ්‍යාසයක් ද ඇත. ඩෙංගු රෝගය පාලනය කිරීමේ සහ වැළැක්වීමේ මෙම සැලැස්ම එම පැවැරුම නැවත නැවතත් අප වෙත සිහිකිරීමකි. එම සිහිකැඳවීම ගැඹුරින් තේරුම් ගනිමින් සියලු දෙනා තම වගකීම් මැනවින් ඉටු කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි.*

**මෛත්‍රීපාල සිරිසේන**
**ජනාධිපති**
**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

# පසුබිම

*වර්තමානයේ දී ඩෙංගු රෝගය ප්‍රධාන සෞඛ්‍ය ප්‍රශ්නයක්ව පවතී. 2017 ජුනි මස වන විට ශ්‍රී ලංකාවේ 68,053ක් පමණ රෝගීන් සංඛ්‍යාවක් හා මරණ 206 ක් වාර්තා වී ඇත (මරණ අනුපාතිකය 0.3 %). නිරිත දිග වර්ෂා තත්ත්වය හේතුවෙන් ඉදිරි මාස කීපය තුළ දී ඇතිවිය හැකි ඩෙංගු වසංගත තත්ත්වය මැඩ පැවැත්වීම පිණිස ප්‍රතිකාර සහ වළක්වා ගැනීම සඳහා කටයුතු කරන ආයතන කඩිනම් ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීම ඉතා අත්‍යාවශ්‍ය වේ.*

*දැනට පවතින කීට විද්‍යා සමීක්ෂණ වාර්තා අනුව, ඩෙංගු මදුරුවන්ගෙන් 40% පමණ බෝවන්නේ ඉවතලන භාජන තුළ බැවින්, විධිමත් කැළි කසල බැහැර කිරීම පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. ඊට අමතරව ඉදිකරමින් පවතින ගොඩනැඟිලි, පාසල්, ආගමික ආයතන සහ අනෙකුත් ආයතන යනාදියේ මදුරුවන් බෝවන තැන් බහුලව ඇති බැවින්, මෙය වළක්වා ගත හැකි ක්‍රමවේදයන් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ඩෙංගු රෝගය නිසා ඇතිවන මරණ අවම කර ගැනීම සඳහා දැනට ඇති විද්‍යාත්මක දත්ත භාවිතයෙන් පහත සඳහන් අරමුණු යෝජනා කෙරේ.*

# අරමුණු


*01. රෝගීන් කලින් හඳුනා ගැනීම සහ රෝගීන් හට ප්‍රතිකාර කිරිම තවදුරටත් ශක්තිමත් කිරීම.*

*02. වසංගත තත්ත්වයන් මර්දනය කිරීම සඳහා ඇති හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම.*

*අනෙකුත් බොහෝ සෞඛ්‍ය දර්ශක උසස් මට්ටමක පැවතිය ත්, ඩෙංගු රෝගය වසංගත තත්ත්වයෙන් පවතින බැවින්, එය මැඩලීම සඳහා අඛණ්ඩ මර්දන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.*

*මෙම අරමුණු කරා ළඟා වීමට ජනාධිපති කාර්ය සාධක බලකායෙන් නියම වූ පරිදි පළාත් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා විහිදුනු ව්‍යුහය ස්ථාපිත කිරීම වැදගත් වේ.*

# ඩෙංගු මර්දනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ව්‍යුහය




*අධ්‍යාපන, පරිසර, ආරක්ෂක, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ පළාත් සභා, ආපදා කළමනාකරණ සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ

ඩෙංගු මර්දනය උදෙසා වඩාත්ම ක්‍රියාකාරී කමිටුව විය යුත්තේ ග්‍රාමීය කමිටුවයි. එම කමිටුවේ කටයුතු ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් මත, ග්‍රාම නිලධාරීන්ගේ මෙහෙයවීම යටතේ ඉහත ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවිය යුතුය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අදාළ ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහ පළාත් පාලන ආයතනයේ පුරපති/ නගරාධිපති/ සභාපති ප්‍රධානත්වයෙන් ඉහත සඳහන් ක්‍රියාවලිය ස්ථාපිත කිරීම වැදගත් වේ.

| ආයතන තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සැලැස්ම | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **වගකීම දැරිය යුතු ආයතනයන්** | **ළඟා විය යුතු ඉලක්කයන්** |
| **1. ඩෙංගු මර්දන වැඩසටහන ජූනි මස පළමු වන දින සිට මාස තුනක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.**<br><br>**2. <u>සෑම සතියකම</u> එක් <u>නියමිත දිනක</u> සියලුම ආයතන (රජයේ සහ පෞද්ගලික) සහ ආගමික ස්ථාන <u>පැයක්</u> තම පරිශ්‍රය පිරිසිදු කිරීම් කටයුතුවල නිරත වීම.**<br><br>**රජයේ සහ පුද්ගලික ආයතන, ආගමික ස්ථානවල**<br>- රජයේ සහ පුද්ගලික ආයතන, ආගමික ස්ථාන/පරිශ්‍ර තුල ඇති මදුරුවන් බෝවන ස්ථාන, <u>සෑම සතියකම</u> අවම වශයෙන් එක් <u>නියමිත</u> <u>දිනක</u> <u>පැයක්</u> (සුදුසු වෙලාවක) සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පරීක්ෂාවට ලක් කිරීම.<br>  - පරිශ්‍රය සහ අවට පරිසරය කලාප වලට වෙන්කර, අදාළ නිලධාරීන්ට වගකීම ලබාදීම.<br>  - කසළ කළමනාකරණය සඳහා තිරසාර විසඳුමක් ලබාදීම.<br>    ✓ *සියලුම නිලධාරීන් කසළ වර්ගීකරණය පිළිබඳව දැනුවත් කිරීම.*<br>    ✓ *ආයතනයට පොලිතීන් ගෙන ඒමෙන් වැළැකීම.*<br>    ✓ *කසළ අවම කිරීම.*<br>    ✓ *ආපනශාලාවලින් ඉවත් කරන දිරන හා නොදිරන අපද්‍රව්‍ය, සහ අපජලය නිසියාකාරව බැහැරලීම.*<br>    ✓ *කසළ වර්ගීකරණය නිසියාකාරව සිදුවෙනවාද යන්න අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කර ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම.*<br>- අලංකාරය සඳහා ඇති පොකුණුවලට මදුරු කීට භක්ෂක මාළුන් යෙදීම. | සියලුම රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන<br>පළාත් පාලන ආයතන<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,<br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සියලුම රජයේ සහ පුද්ගලික ආයතන, සහ ආගමික ස්ථානයක්ම මදුරුවන් බෝවන ස්ථාන රහිත පරිශ්‍ර බවට පත්වීම |

| | | |
|---|---|---|
| - ජනාධිපති චක්‍රලේඛයට අනුව, ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත මාසික වාර්තාවක් යැවීම.<br>- තාක්ෂණික උපදෙස් සඳහා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හෝ  සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා හමුවන්න.<br>- ඉදිකිරීම් පරිශ්‍ර පිළිබඳව දැඩි අවධානයක් යොමුකිරීම. : එය වගකීම් භාර නිලධාරියා, සෞඛ්‍ය සහ ආරක්ෂණ නිලධාරියෙකු සමඟ අධීක්ෂණය කිරීම. | | |

## පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා සැලැස්ම

| ක්‍රියාකාරකම් | වගකීම දැරිය යුතු ආයතනයන් | ළඟා විය යුතු ඉලක්කයන් |
|---|---|---|
| <u>පාසල්</u><br><br>**1. ඩෙංගු මර්දන වැඩසටහන ජුනි මස පළමු වන දින සිට මාස තුනක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.**<br>**2. <u>සෑම සතියකම</u> එක් <u>නියමිත දිනක</u> සියලුම පාසල් (රජයේ සහ පෞද්ගලික) <u>පැයක්</u> තම ස්ථානය පිරිසිදු කිරීම් කටයුතුවල නිරත වීම.**<br>- සියලුම පාසල් පරිශ්‍ර තුළ ඇති මදුරුවන් බෝවන ස්ථාන, <u>සෑම සතියකම</u> අවම වශයෙන් එක් <u>නියමිත දිනක</u> <u>පැයක්</u> සියලුම ළමුන් හා ගුරුවරුන් සහභාගීත්වයෙන්, පරීක්ෂාවට ලක් කිරීම. (උදා: සිකුරාදා උදේ 11.00 සිට 12.00 දක්වා)<br>- පාසැල් ඩෙංගු මර්දන කමිටු ස්ථාපිත කොට ශක්තිමත් කිරීම.<br>- පන්ති කාලසටහනට නියමිත පැයක කාලයක් ඇතුළත් කිරීම.<br>- පාසැල් පරිසරය කලාප වලට වෙන්කර, අදාල පන්තිවලට වගකීම ලබාදීම.<br>- සෑම සතියකම එක් දිනක් පැයක කාලයක් පාසල පිරිසිදු කිරීම.<br>- පාසල් ඩෙංගු මර්දන කමිටුව විසින් නිතිපතා අධීක්ෂණය කිරීම: සතිපතා වාර්තාවක් විදුහල්පතිට ලබාදීම.<br>- සෑම විදුහල්පතිවරයකු විසින්ම මාසික වාර්තාවක් කලාප අධ්‍යක්ෂක සහ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලබා දීම.<br><br><u>උසස් අධ්‍යාපන ආයතන</u> | අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සියලුම පාසල් ඩෙංගු මදුරුවන් බෝවන ස්ථානවලින් තොර පාසල් වීම.<br><br>සෑම සතියකම නියමිත වේලාවකදී ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කරන පාසල් බවට පත්වීම. |

| | | |
|---|---|---|
| **3. <u>සෑම සතියකම</u> එක් <u>නියමිත දිනක පැයක්,</u> සියලුම උසස් අධ්‍යාපන ආයතන (රජයේ සහ පෞද්ගලික) සියලුම සිසුන් හා කථිකාචාර්යවරුන් සහභාගීත්වයෙන් පිරිසිදු කිරීම් කටයුතුවල නිරත වීම.**<br>- උසස් අධ්‍යාපන ආයතනවල ඩෙංගු මර්දන කමිටු ස්ථාපිත කොට ශක්තිමත් කිරීම. | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | |
| **4. ඩෙංගු මර්දනය සඳහා අඛණ්ඩව කළ යුතු වෙනත් කාර්යයන්**<br>• සෑම පාසල් නිවාඩු කාලයකට පසු, පාසල් පටන් ගැනීමට පෙර දෙමවුපියන් හා පාසල් ළමුන් එක්ව මදුරුවන් බෝවන ස්ථාන පිරිසිදු කිරීම.<br>• ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සම්බන්ධ ක්ෂේත්‍ර සමීක්ෂණ පත්‍රය නිතිපතා සම්පූර්ණ කිරීම සහ ගැටළු සහිත ස්ථාන ඉහල නිලධාරීන් හට දැනුම්දීම.<br>• ආයතන ප්‍රධානියා සහ ඉහළ නිලධාරීන් එම ගැටළු සහිත ස්ථාන පරීක්ෂා කර ඒවා නිරාකරණය කිරීමට කටයුතු කිරීම.<br>• සෑම මසකටම වරක් සියලුම පාසල්වල මදුරු බෝ වීමේ ප්‍රවණතාවය පිළිබඳ වාර්තාවක් කලාප අධ්‍යක්ෂ වෙත යැවීම සහ එහි සංක්ෂිප්ත වාර්තාවක් අධ්‍යාපන අමාත්‍යාංශයටද යොමුකිරීම.<br>• පාසල්වල/උසස් අධ්‍යාපන ආයතනවල කසළ කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් සැකසීම.<br>✓ *සියලුම සිසුන් කසළ වර්ගීකරණය පිළිබඳව දැනුවත් කිරීම.*<br>✓ *පොලිතීන් පාසලට ගෙන ඒම වැළැක්වීම. - "No polythene" policy*<br>✓ *කසළ අවම කිරීම.*<br>✓ *නේවාසිකාගාර සහ ආපනශාලා වලින් ඉවත් කරන දිරන හා නොදිරන අපද්‍රව්‍ය, සහ අපජලය නිසියාකාරව බැහැරලීම.*<br>✓ *කසළ වර්ගීකරණය නිසියාකාරව සිදුවෙනවාද යන්න අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කර* | පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | |

| | | |
|---|---|---|
| *ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම.*<br>- තටාක හා ජල ටැංකිවලට අවධානය යොමු කර ඒවා නිසි පරිදි කළමනාකරණය කිරීම සහ අලංකාරයට ඇති පොකුණුවලට මදුරු කීට භක්ෂක මාළුන් යෙදීම.<br>- පාසලේ හෝ උසස් අධ්‍යාපන ආයතන වල ඉදිකිරීම් කරන ස්ථාන නිරතුරුව පරීක්ෂාවට ලක් කිරීම.<br>- මේ සම්බන්ධයෙන් කරන කටයුතුවලට අදාළව වෙනම ගොනුවක් තැබීම සහ එය යථාවත් කිරීම.<br>- ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම පිළිබඳව අන්තර් පාසැල් හා දිස්ත්‍රික්ක මට්ටමින් තරග පැවැත්වීම. | සියලුම විදුහල්පතිවරුන්/ උපකුලපතිවරුන්<br><br>ජාතික අධ්‍යාපන ආයතනය | |

## නිවාස පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සැලැස්ම

| ක්‍රියාකාරකම් | වගකීම දැරිය යුතු ආයතනයන් | ළඟා විය යුතු ඉලක්කයන් |
|---|---|---|
| **1. ඩෙංගු මර්දන වැඩසටහන ජූනි මස පළමු වන දින සිට මාස තුනක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.**<br><br>**<u>නිවාස පරීක්ෂාව</u>**<br>- ගෙදර සිටින සියලුදෙනාම සතියකට එක දවසක් නියමිත වේලාවක මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කර ඉවත් කිරීම.<br>- ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ශක්තිමත් කිරීම.<br>  - සියලුම ග්‍රාම නිලධාරීන්, ප්‍රජා නායකයන් හා එකමුතුව ක්‍රියාකාරී සෞඛ්‍ය කමිටු පිහිටුවා ගැනීම.<br>- කසළ කළමනාකරණය සඳහා තිරසාර විසඳුමක් ලබා දීම.<br>  ✓ සියලුම නිවැසියන් කසළ වර්ගීකරණය පිළිබඳව දැනුවත් කිරීම.<br>  ✓ පොලිතීන් භාවිතය අවම කිරීම.<br>  ✓ කසළ අවම කිරීම.<br>  ✓ ඉවත් කරන දිරන හා නොදිරන අපද්‍රව්‍ය, සහ අපජලය නිසියාකාරව බැහැරලීම.<br>- ගෙවල්වල අලංකාරයට ඇති පොකුණුවලට මදුරු කීට භක්ෂක මාළුන් යෙදීම.<br>- ප්‍රජා ක්‍රියාකාරකමක්/සත්කාරයක් ලෙස, හිස් ඉඩම් භෝග වගා කිරීමට යොදාගැනීම.<br>- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ තුළ අධි අවදානම් කලාප නිරතුරුවම පරීක්ෂාවට ලක් කිරීම.<br>- ග්‍රාම නිලධාරීන්, වැඩි අවධානම් ප්‍රදේශවල සතියකට වරක් ද, අනෙකුත් ප්‍රදේශවල මසකට වරක්ද ග්‍රාමීය කමිටුවේ දී මේ පිළිබඳව සාකච්ඡා කිරීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සියලුම | ප්‍රජා කමිටු /සෞඛ්‍ය කමිටු පිහිට වූ ග්‍රාම නිලධාරි ප්‍රදේශ<br><br>වැඩි අවධානම් ග්‍රාම නිලධාරි ප්‍රදේශ මදුරුවන් බෝවන ස්ථානවලින් තොර ප්‍රදේශ බවට පත්වීම |

| | | |
|---|---|---|
| එමෙන් ම, වැඩි අවධානම් ප්‍රදේශවල, ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන්, සතිපතා ප්‍රාදේශීය කමිටුව පවත්වා, ඩෙංගු මර්දන කටයුතු පිළිබඳව ප්‍රගති සමාලෝචන වාර්තාවක් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.<br>- සතියකට වරක් සියලුම පරිශ්‍රවලින් නොදිරන කසළ ඉවත් කිරීම සඳහා කටයුතු කිරීම.<br>- ග්‍රාමීය කමිටු රැස්වීමේ දී, මදුරුවන් බෝවන ස්ථානවලින් තොර නිවාස ඇගයීමට ලක් කිරීම. | දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් | |

| ඉදිකිරීම් පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සැලැස්ම | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **වගකීම දැරිය යුතු ආයතනයන්** | **ළඟා විය යුතු ඉලක්කයන්** |
| **1. ඩෙංගු මර්දන වැඩසටහන ජූනි මස පළමු වන දින සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.**<br>- ප්‍රධාන ගොඩනැඟිලි ඉදිකිරීම් කරන ස්ථානවල සෞඛ්‍ය සහ ආරක්ෂණ නිලධාරියෙකු *(Health and Safety officer)* හෝ මදුරු මර්දන කාර්යය සඳහා නිලධාරියෙකු පත්කිරීම.<br>- ගොඩනැඟිලි ඉදිකිරීම් මදුරුවන් බෝවිය හැකි ස්ථානවලින් තොරව පරිසර හිතකාමී ලෙස ප්‍රමිතිකරණයට ලක් කිරීම. (උදා: පීලි රහිත ගොඩනැගිලි සහ ජලය එකතු නොවන ලෙස ඉදිවන සඳළුතල, කොන්ක්‍රීට් තට්ටු, නළ ළිං යනාදිය)<br>- නිරතුරුව ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන ඇති දැයි පරීක්ෂාවට ලක් කිරීම. (උදා: බෝතල්, ටයර්, ප්ලස්ටික්, ටැංකි, බැරල්, යන්ත්‍රෝපකරණ යනාදිය )<br>- ළඟා වීමට අපහසු ස්ථානවල වතුර රැඳී ඇත්නම් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමාගේ සහය ඇතිව කීට නාශක බෙහෙත් ඉසීම සහ අවශ්‍ය නම් දුමායනය කිරීම.<br>- සියලුම ඉදිකිරීම් සේවකයින් අවට පරිසරය පිරිසිදුවට තබා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සහ මදුරු දැල් භාවිතා කිරීම සඳහා උපදෙස් දීම.<br>- කසළ කළමනාකරණය සඳහා තිරසාර විසඳුමක් ලබාදීම.<br>✓ *කසළ වර්ගීකරණය පිළිබඳව දැනුවත් කිරීම.*<br>✓ *ඉදිකිරීම් පරිශ්‍රය තුළට පොලිතීන් ගෙන ඒමෙන් වැළැකීම.*<br>✓ *කසළ අවම කිරීම.*<br>✓ *ඉවත් කරන දිරන හා නොදිරන අපද්‍රව්‍ය සහ අපජලය නිසියාකාරව බැහැරලීම.* | පළාත් පාලන ආයතන, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය/ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) | සියලුම පරිශ්‍ර තුළ සෞඛ්‍ය සහ ආරක්ෂණ නිලධාරියෙකු *(Health and Safety officer)* සහ මදුරු මර්දන කාර්ය සඳහා නිලධාරියෙකු සිටීම.<br><br>මදුරුවන් බෝවන ස්ථානවලින් තොර වූ ඉදිකිරීම් පරිශ්‍ර |

| | | |
|---|---|---|
| ✓ *කසළ වර්ගීකරණය නිසියාකාරව සිදුවෙනවාද යන්න අධීක්ෂණය කිරීම.*<br>• ඩෙංගු රෝගය පාලනය කිරීම සහ වළක්වා ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හෝ  සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා හමුවන්න.<br>• ඩෙංගු බෝවන ස්ථාන සම්බන්ධයෙන් මාසික වාර්තාවක් ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යැවීම.<br>• සෑම ප්‍රධාන ගොඩනැගිලි ඉදිකිරීම් පරිශ්‍රයක්ම අදාල පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කිරීම සහ මසකට වරක් වාර්තාවක් පළාත් පාලන ආයතනයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමාට යැවීම | | |

| ධීවර වරාය සහ ධීවර බෝට්ටු තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සැලැස්ම | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **වගකීම දැරිය යුතු ආයතනයන්** | **ළඟා විය යුතු ඉලක්කයන්** |
| **ධීවර වරාය සහ ධීවර බෝට්ටුවල මදුරුවන් බෝවීම වැළැක්වීම.**<br>✓ *බෝට්ටු අයිතිකරුවන්, නඩත්තුකරුවන් හා භාවිතා කරන්නන් මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳ දැනුවත් කිරීම.*<br>✓ *ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව වරාය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම.*<br>✓ *අත්හැර දමන ලද බෝට්ටු හා ධීවර යාත්‍රා වරායෙන් ඉවත් කරන තුරු, එම යාත්‍රා තුළ මදුරුවන් බෝවන ස්ථාන ඉවත් කිරීම හා පාලනයට පහසුවන ලෙස හඳුනාගත් නිශ්චිත ස්ථානයක තැබීම.*<br>✓ *දී ඇති කාල පරාසයක් තුළ බෝට්ටු හා ධීවර යාත්‍රා ඉවත් කර ගැනීම සඳහා නීති ප්‍රතිපාදන සහ ක්‍රමවේද සැකසීම.*<br>✓ *ධීවර කටයුතු සඳහා රැගෙන යන ප්ලාස්ටික් භාජන හා පොලිතීන් වෙරළාසන්න ප්‍රදේශවලට මුදාහැරීමෙන් වැළකීම සහ එම කසළ කළමනාකරණය සඳහා නියමිත ක්‍රමවේදයක් අනුගමනය කිරීම.* | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සියලුම අත්හැර දමන ලද බෝට්ටු හා ධීවර යාත්‍රා ඉවත් කිරීම.<br><br>වෙරළාසන්න ප්‍රදේශ සහ වරායන් කසළවලින් තොර වීම. |

<table>
<tr><th colspan="3">ජනමාධ්‍ය මඟින් ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා සැලැස්ම</th></tr>
<tr><th>ක්‍රියාකාරකම්</th><th>වගකීම දැරිය යුතු ආයතනයන්</th><th>ළඟා විය යුතු ඉලක්කයන්</th></tr>
<tr><td>
1. ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා ජනමාධ්‍ය මඟින් සිදු කරන ඵලදායී සන්නිවේදනය<br>
- ජුනි මස පළමු වන දින ආරම්භ කිරීමට නියමිත ඩෙංගු මර්දන වැඩසටහන පිළිබඳව සියලුම පුවත්පත්වල ප්‍රචාරය කිරීම. සඳහා දැන්වීම් පලකිරීම (විවිධ අමාත්‍යාංශ මඟින්: උදා: සෞඛ්‍ය, අධ්‍යාපන, පරිසර අමාත්‍යාංශ හා පළාත්පාලන ආයතන යනාදි)<br>
- සියලුම මාධ්‍යවල එකම වෙලාවක එකම පණිවිඩය ප්‍රචාරය කිරීම සහ එම වෙලාවේදී සියලුම ජනතාව, සියලුම වෘත්තිකයන් ද ඇතුළුව, එම ක්‍රියාකාරකමට අනුගත වීම.<br>
- ජනමාධ්‍ය කේන්ද්‍ර කොට ප්‍රජාව බලාත්මක කිරීම සඳහා කෙටි පණිවිඩ ප්‍රචාරය කිරීම.<br>
    ✓ ජුනි මස පළමු වන දින සිට මාස තුනක් සියලුම නාලිකා වල ප්‍රධාන පණිවිඩයක් ලෙස මෙය ප්‍රචාරය කිරීම.<br>
- මාධ්‍ය දැනුවත් කිරීම සඳහා තාක්ෂණික මඩුල්ලක් පත් කිරීම සහ ඒ අය ලවා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම.<br>
(උදා: ළමා රෝහලේ හෝ අනෙකුත් රෝහල්වල ළමා සහ කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්, ජාතික ඩෙංගු මර්දන ඒකකයේ සියලුම වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය සහ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ නිලධාරීන් එක්ව මාධ්‍ය දැනුවත් කිරීම.)<br>
- මාධ්‍ය තුළින් නිවාස, වැඩබිම් (ඉදිකිරීම් ස්ථාන), පාසල්, සහ සේවා ස්ථාන පිරිසිදුව මදුරුවන් බෝවන ස්ථානවලින් තොරව තබාගැනීම පිළිබඳව දැනුවත් කිරීම.
</td><td>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, මාධ්‍ය ආයතන</td><td>සියලුම ජනමාධ්‍ය මඟින් ඩෙංගු රෝගය සහ මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම</td></tr>
</table>

| | | |
|---|---|---|
| ✓ කොන්ක්‍රීට් වහල, වැහිපීලි වැනි ජලය රැස්විය හැකි ස්ථාන පිරිසිදු කරන්න.<br>✓ ජලය රැස්කරන බඳුන් / ටැංකි මදුරුවන්ට ඇතුළුවිය නොහැකි සේ ආවරණය කරන්න.<br>✓ ජලය රැස් කරන බඳුන්, ටැංකි , මල් පෝච්චි, කුරුළු නාන තටාක යනාදියේ ජලය ඉවත් කර ඇතුල් පෘෂ්ඨ හොඳින් අතුල්ලා පිරිසිදු කරන්න.<br>✓ ජලය එකතු නොවන සේ කසළ නිසි ලෙස වර්ගීකරණය කර බැහැර කරන්න.<br>✓ ටයර් තුල ජලය එකතුවන්නට ඉඩ නොතබන්න. ඒවා ඉවත් කරන්න. නිසි පරිදි ගබඩා කරන්න.<br>• මාධ්‍ය ආයතන හරහා කෙටි රූපවාහිනී දැන්වීම් (*Jingles*) සෑදීමට කටයුතු කිරීම.<br>• ජාතික මට්ටමේ සිදු කරන වැඩසටහන් සහ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් සඳහා මාධ්‍ය ප්‍රචාරය ලබාගැනීම.<br>• ඩෙංගු මර්දනය සම්බන්ධ වැඩසටහන් නොමිලේ ප්‍රචාරය කරවීම.<br>• අදාළ පරිශ්‍රවල මදුරුවන් බෝවිය හැකි ස්ථාන පරීක්ෂා කළ යුතු නියමිත වේලාවන් සම්බන්ධව ජනමාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම.<br>(උදා: පාසැල් සඳහා සිකුරාදා උදේ 11.00 සිට 12.00 දක්වා, ආයතන සහ ඉදිකිරීම් ස්ථාන සඳහා සිකුරාදා උදේ, නිවෙස් සහ ආගමික ස්ථාන සඳහා ඉරිදා උදේ) | | |

# නියාමනය සහ ඇගයීම

## ආයතන (රජයේ සහ පෞද්ගලික ආයතන)

- ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත මාසික වාර්තාවක් යැවීම සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් එම ස්ථාන අධීක්ෂණය කිරීම.

## පාසල්

- පාසල් ඩෙංගු මර්දන කමිටුව විසින් නිතිපතා අධීක්ෂණය කිරීම: විදුහල්පතිට සතිපතා වාර්තාවක් ලබාදීම.
- සෑම විදුහල්පතිවරයකු විසින්ම මාසික වාර්තාවක් කලාප අධ්‍යක්ෂක සහ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලබාදීම.
- සෑම මසකටම වරක් සියලුම පාසල්වල මදුරු බෝ වීමේ ප්‍රවණතාවය පිළිබඳ වාර්තාවක් කලාප අධ්‍යක්ෂ වෙත යැවීම සහ එම වාර්තාවේ සංක්ෂිප්තය අධ්‍යාපන අමාත්‍යාංශයටද යොමුකිරීම.

## නිවාස

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශවල ඩෙංගු බෝවන ස්ථාන සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රාදේශීය වසංගතවේදී වෛද්‍යවරයාට ලබාදීම.
- ග්‍රාම නිලධාරීන්, වැඩි අවධානම් ප්‍රදේශවල සතියකට වරක් ද අනෙකුත් ප්‍රදේශවල මසකට වරක්ද වාර්තාවක් ග්‍රාමීය කමිටුවට ඉදිරිපත් කිරීම.
- එමෙන්ම වැඩි අවධානම් ප්‍රදේශවල, ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන්, ප්‍රාදේශීය කමිටුව සතිපතා පවත්වා, ඩෙංගු මර්දන කටයුතු පිළිබඳව ප්‍රගති සමාලෝචන වාර්තාවක් මහජන සෞඛ්‍ය පරීක්ෂක මඟින් දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීම ත්, දිස්ත්‍රික් ලේකම් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත එම වාර්තාව ඉදිරිපත් කිරීම සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් එම වාර්තා ඩෙංගු මර්දනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත ඉදිරිපත් කිරීම.
- මාසිකව සංක්ෂිප්ත වාර්තාවක් පළාත් ප්‍රධාන ලේකම් මඟින් ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත යැවීම.

## ඉදිකිරීම් පරිශ්‍ර තුළ

- ඩෙංගු බෝවන ස්ථාන සම්බන්ධයෙන් මාසික වාර්තාවක් ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යැවීම.
- සෑම ප්‍රධාන ගොඩනැගිලි ඉදිකිරීම් පරිශ්‍රයක්ම අදාල පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කිරීම සහ මසකට වරක් වාර්තාවක් පළාත් පාලන ආයතනයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමාට යැවීම.

## ධීවර වරාය සහ බෝට්ටු

- අදාළ ධීවර වරාය ප්‍රදේශවල සහ බෝට්ටු වල ඩෙංගු බෝවන ස්ථාන සම්බන්ධයෙන් මාසික වාර්තාවක් ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ප්‍රාදේශීය වසංගතවේදී වෛද්‍යවරයාට ලබාදීම.

## ***Mosquito Breeding Inspection Check List***

| | | | |
|---|---|---|---|
| **1.** | ***Water storage barrels*** | 11. | ***Natural (Leaf Axils, Tree holes, Bamboo stumps)*** |
| **2.** | *Water storage cement tanks* | 12. | *Discarded (degradable items)* |
| **3.** | *Other water storage containers (cans, pots etc.)* | 13. | *Discarded non degradable items)* |
| **4.** | *Concrete Slabs* | 14. | *Discarded (Reusable items)* |
| **5.** | *Tyres* | 15. | *Pet feeding Cups* |
| **6.** | *Ornamental and horticulture items (flower pots, vases, Tanks without fish, bird baths)* | 16. | *Nonfunctional Toilet Systems (Cisterns & commodes)* |
| **7.** | *Wells (shallow cemented wells)* | 17. | *Roof Gutters (blocked with leafs)* |
| **8.** | *Tube wells* | 18. | *Ponds (cement ponds without fish and disused pools)* |
| **9.** | *AC & Refrigerator Trays* | 19. | *Temporarily removed items (scrap metal, roof tiles, plastic ware, etc.)* |
| **10.** | *Covering items (polythene sacks)* | 20. | *Others (wet floors, earth pipes, concrete drains, concrete holes)* |

# <u>ස්ථාන නිරීක්ෂණ පත</u>

**රජයේ හෝ පෞද්ගලික ආයතන/කර්මාන්ත ශාලා/ආගමික ස්ථාන හා පොදු පරිශ්‍ර ආශ්‍රිතව**
**මදුරුවන් බෝවන ස්ථාන නිරීක්ෂණය කිරීමේ නිරීක්ෂණ සටහන් පත්‍රය**

දිනය: ........................ ආරම්භ කළ වේලාව ......................... අවසාන කළ වේලාව .........................

| | |
|---|---|
| *සෞ: වෛ:නි කොට්ඨාශය/පළාත් පාලන බල ප්‍රදේශය | |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශය | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාශය | |
| ආයතනයේ නම සහ ලිපිනය | |

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ........................................................ | .................................. |
| 2 | ........................................................ | .................................. |
| 3 | ........................................................ | .................................. |
| 4 | ........................................................ | .................................. |

| ආයතනය තුළ හා එළිමහන් ස්ථාන | පරීක්ෂා කළ ස්ථාන | මදුරු කිටයන් සහිත ස්ථාන (මදුරු කිටයින් සිටි නම් ස්ථාන ගණන සඳහන් කරන්න.): ජල ටැංකි සහ ජලය රැස් කරනා බඳුන් | වැසි පීලි | කිට නාශක මසුන් රහිත පොකුණු සහ | ජලය බැසීම අවහිර | කොන්ක්‍රීට් ස්ලැබ් | ටයර් | ශාක/ බ්‍රොමිලියඩ ආදී | භාවිතා නොකරන වැසිකිළි | ශීතකරණ/ වායු සමීකරණ | ඉවතලන භාජන හා අයිතම(A1) | මල් බඳුන් | වෙනත් (A 2) | කිටයන් සහිත මුළු ස්ථාන ගණන | කාණු සහ පලි වලවල්: පැහැදිලි ජලය සහිත | කාණු සහ පලි වලවල්: පැහැදිලි ජලය රහිත | මදුරුවන් බෝවිය හැකි ජලය සහිත ස්ථාන: ජලය සහිත | මදුරුවන් බෝවිය හැකි ජලය සහිත ස්ථාන: වියළි | මුළු නිවැරදි කළ ස්ථාන: කිටයන් සහිත ස්ථාන | මුළු නිවැරදි කළ ස්ථාන: කිටයන් රහිත බෝවිය හැකි ස්ථාන | ගැටළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය තුළ | කාර්යාල පරිශ්‍රය | | | | | | | | | | | | | | | | | | | | |
| | තනි මහල් ගොඩනැගිලි | | | | | | | | | | | | | | | | | | | | |
| | මහල් ගොඩනැගිලි - | | | | | | | | | | | | | | | | | | | | |
| | දෙවන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | තෙවන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | සිව්වන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | පස්වන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | හයවන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | හත්වන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | අටවන මහල | | | | | | | | | | | | | | | | | | | | |
| | වෙනත් ගොඩනැගිලි | | | | | | | | | | | | | | | | | | | | |
| | ආපනශාලා පරිශ්‍රය සහ මුළුතැන්ගෙය | | | | | | | | | | | | | | | | | | | | |
| | ඉදිකිරීම් පරිශ්‍රය | | | | | | | | | | | | | | | | | | | | |
| | වැසිකිළි පද්ධති පරිශ්‍රය | | | | | | | | | | | | | | | | | | | | |
| එළිමහන් ස්ථාන | අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රය | | | | | | | | | | | | | | | | | | | | |
| | වාහන අංගනය | | | | | | | | | | | | | | | | | | | | |
| | උද්‍යානය | | | | | | | | | | | | | | | | | | | | |
| | ජල පවිත්‍ර ඒකකය | | | | | | | | | | | | | | | | | | | | |
| | අබලි ද්‍රව්‍ය එක්රැස් කරන ස්ථානය | | | | | | | | | | | | | | | | | | | | |

A1 ලෙස ප්ලාස්ටික් කෝප්ප,යෝගට් කෝප්ප, කිරිහට්ටි,බෝතල්,පෙල්ලම් බඳු කොටස්, පිගන් කැබලි,ටින්,ලී පෙට්ටි,ඉවතලන පොලිතින් සිට ,ප්ලාස්ටික් දවටන, පොලිතින්සිට්, පොලිස්ටයිරීන් ද්‍රව්‍ය ,බියර් කෑන් ආදිය සලකන්න.

A2 ලෙස පරිශ්‍ර ඇතුලත- ජලය එක් රැස් විය හැකි සඳලු තල, තාවකාලිකව ජලය රැස්වන ස්ථාන-වතුර කාන්දු වන ස්ථාන සඳහා යොදු බකට් ද පරිශ්‍රවලින් පිටත - ඉවත්කල උළුකැට , කැඩුණු ගොඩනැගිලි අයිතම්, අබලි ද්‍රව්‍ය, භූගත බට, ඇන්ටෙනා බට කැඩුණු වැසිකිළි වලවල් , වැසි ආවරණ සඳහා යොදා ඇති පොලිතින් දවටන, මුහින් නමා ඇති බකට් වල දාර සලකන්න.

පෝරමය පිරවීමේදී මදුරු කිටයින් සිටි නම් ස්ථාන ගණන ද නොමැති නම් 'x' ලකුණ ද යොදන්න.

* සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශය